**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය - I කොටස**

**10 ශ්‍රේණිය**

**I වාර පරීක්ෂණය - 2013** පැය 1 1/2

❖ **1-20 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ලියන්න.**

1) රංග මාසික ආදායම ඇඳුම් පැළඳුම්,ආහාර පාන සෞඛ්‍ය හා තම නිවස ඉදිකිරීම වෙනුවෙන් වැය කොට තිබුනි.මෙහිදී ඔහු සිය ආදායම වැය කොට ඇත්තේ

1. වුවමනා සම්පූර්ණ කිරීම සඳහා.
2. අවශ්‍යතා තෘප්තිමත් කරගැනීම
3. අනාගත අභිවෘද්ධිය සඳහා .
4. ජීවන වියදම අවම කර ගැනීම සඳහා.

2) ව්‍යාපාරයක් යනු

1. ලාභ ලැබීමේ අරමුණින් කරනු ලබන ඕනෑම කටයුත්තකි.
2. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ ඕනෑම කටයුත්තකි.
3. භාණ්ඩ නිෂ්පාදනය හා බෙදා හැරීමයි.
4. පුද්ගලයන් දෙදෙනකු විසින් ගන්නා ගිවිසුමකි.

3) භාණ්ඩ මෙන්ම සේවා ද මිනිස් අවශ්‍යතා සපුරා දෙයි. භාණ්ඩයක මෙන්ම සේවාවක ද ලක්ෂණයකි.

1. භෞතික පැවැත්මක් තිබීම.
2. ස්පර්ශ කළ හැකි වීම.
3. මිලක් පැවතීම.
4. ගබඩා කළ හැකි වීම.

4) මෙහි අදහස් යන සංකල්පය නිරූපනය කරන නිදසුන නිවැරදිව දැක්වෙන කාණ්ඩය වන්නේ,

1. දූරකථන,වට්පනම්,ජනමාධ්‍ය
2. තොරතුරු,ශිල්පීය,දැනුම,තාක්ෂණය.
3. කළමනාකරණ අදහස්,ජනමාධ්‍ය,තොරතුරු.
4. ජන මාධ්‍යය,ගුවන් විදුලිය,තොරතුරු

5) ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථික කටයුතු වල දී තේ වගාවට වැදගත් තැනක් හිමිව ඇත.මෙරට තේ වගාව,

1. සෘජු නිෂ්පාදනයට.
2. වක්‍ර නිෂ්පාදනයට.
3. ද්විතියික නිෂ්පාදනයට.
4. තෘතීක නිෂ්පාදනයට. කදිම නිදසුනකි

6) ආර්ථික ප්‍රතිපත්ති සැකසීමේ දී රජයේ උපදේශකයා ලෙස කටයුතු කරන්නේ

1. ආයෝජන මණ්ඩලය.
2. ප්‍රාග්ධන වෙළඳපොළ.
3. ශ්‍රී ලංකා මහ බැංකුව.
4. කොටස් වෙළඳපොළ.

7) සිංහ සමාජය ඔබ හඳුනා ගත්තේ,

1. පෞද්ගලික අංශයේ ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක් ලෙසය.
2. පෞද්ගලික අංශයේ ලාභ අරමුණුකර නොගත් ව්‍යාපාරයක් ලෙසය.
3. පොදු අංශයේ ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක් ලෙසය.
4. පොදු අංශයේ ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාරයක් ලෙසය.

* **අංක 8-10 දක්වා පහත සිද්ධිය ඇසුරින් පිළිතුරු සපයන්න.**

දෙව්භාන් සාදන රසැති ක්‍රීම් බිස්කට් කෑමට සුභේල ඉතා කැමතිය. එම ක්‍රීම් බිස්කට් තම වෙළඳසැලේ විකුණා ලාභ ලැබීමට මාධව දක්ෂය. දෙව්භාන් ගේ ක්‍රීම් බිස්කට් මිලට ගෙන තම වෑන් රථයෙන් අලෙවිසැල්වලට බිස්කට් අලෙවි කරන්නේ තුෂාරය.

8) තුෂාර ඔබට හැදින්විය හැක්කේ,

1. නිෂ්පාදකයා.
2. සිල්ලර වෙලෙන්දා
3. තොග වෙලෙන්දා.
4. පාරිභෝගිකයා.

9) දෙව්භාත් ඔබට හැදින්විය හැක්කේ,
1. පාරිභෝගිකයා.   2. තොග වෙළෙන්දා.
3. නිෂ්පාදකයා.   4. ව්‍යාපාරිකයා.

10) ක්‍රීම් බිස්කට් නිෂ්පාදන ක්‍රියාවලිය රූප සටහනකට නැගුවහොත් ක්‍රීම් බිස්කට් යනු,
1.යෙදවුම්   2. නිමැවුම   3.සම්පත්   4.කළමනාකරණ ක්‍රියාවලිය

11) ව්‍යාපාරිකයන්ට බාල වයස්කාර දරුවන් සේවයේ නිරත කළ නොහැකිය. මෙසේ වන්නේ,
1. සමාජ හා සංස්කෘතික පරිසරයේ බලපෑම නිසාය.
2. ප්‍රජා පරිසරයේ බලපෑම නිසාය.
3. දේශපාලන හා නෛතික පරිසරයේ බලපෑම නිසාය.
4. ආර්ථික පරිසරයේ බලපෑම නිසාය.

12) මහා යන්ත්‍ර කීපයක් යොදා ගෙන එකම ඇඳුමේ කොටස් විවිධ පුද්ගලයන් විසින් නිම කිරීම මහා පරිමාණ ඇදුම් නිෂ්පාදනයේ සුලභ ක්‍රමයකි.එය හැඳින්විය හැක්කේ,
1. කාර්ය විශේෂිකරණය   2 විශේෂ ප්‍රාගුණ්‍යය
2. ශ්‍රම විභජනය   4. ඉහත සියල්ලම

13) ලංකා බැංකුවේ ගනුදෙනු කරුවෙකු මහජන බැංකු ශාඛාවකින් මුදල් ලබා ගැනීම.
1. දුරකථන බැංකු සේවාවයි.   2. ටෙලර් යන්ත්‍ර ගනුදෙනුවකි.
3. අන්තර් බැංකු කරණයයි.   4. ඒකීය බැංකු කරණයයි.

14) විද්‍යුත් වාණිජ්‍යය ව්‍යාප්තියට බලපෑවේ,
1. කාර්මික විප්ලවයයි   2. රක්ෂණයේ ව්‍යාප්තියයි.
3. සන්නිවේදන තාක්ෂණයේ දියුණුවයි.
4. නව භාණ්ඩ හා සේවා වෙළඳ පොළට පැමිණීමයි.

15) භාණ්ඩ හා සේවා සඳහා මිල ගෙවීමේ දී භාවිතා කෙරෙන මාධ්‍යය හැඳින්වෙන්නේ,
1. වටිනාකම ලෙසය.   2. වෙළඳාම ලෙසය.
3. මුදල් ලෙසය.   4. හුවමාරුව ලෙසය.

16) කාර්මික නිෂ්පාදන පමණක් ඇතුළත් කාණ්ඩය,
1. පත්/ධීවර/පතල් හා කැනීම්   2.රෝදිපිළි හා ඇඟළුම්/වන/ධීවර
3 පතල් හා කැනීම්/ඉදිකිරීම්/නිමවුම්   4.සන්නිවේදන/බැංකු/ නිමවුම්

17) හිමිකාරීත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී තීරණාත්මක සාධකය වන්නේ,
1. භූමියයි.   2. ශ්‍රමයයි.   3. ප්‍රාග්ධනයයි.   4. තාක්ෂණයයි.

18) වෙළඳාම පුළුල් වත් ම එය මැනවින් ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් විවිධ සේවා අවශ්‍ය වේ. ඒවා හඳුන්වනු ලබන්නේ,
1. වාණිජ්‍යය ලෙසිනි.   2. උපකාරක සේවා ලෙසිනි.
3. යටිතල පහසුකම් ලෙසිනි.   4. උපදේශන සේවා ලෙසිනි.

19) පහත සඳහන් භාණ්ඩ අතුරින් අවශ්‍යතා හා ප්‍රවණතා දැක්වෙන කාණ්ඩය වන්නේ,
1. කලිසම්/ගවුම්   2. අධ්‍යාපන/ආහාර
3. සෞඛ්‍ය/විෂබීජ නාශක   4. බස්රථ/පුවත්පත්

20) ජාත්‍යන්තර වෙළඳ පොලේ තිරිඟු පිටි මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යෑම මෑතක සිට දැකිය හැකි ප්‍රවණතාවකි. මේ තත්ත්වය ව්‍යාපාරික වශයෙන් වී වගාවේ නිරත වන්නන්ට,
1. ව්‍යාපාරික ශක්තියකි.   2. ව්‍යාපාරික අභියෝගයකි.
3. ව්‍යාපාරික තර්ජන.
4. ව්‍යාපාරික අභියෝග මනා ලෙස අධ්‍යයනය කළ යුතුයි.

**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**
**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II කොටස**
**10 ශ්‍රේණිය**
**I වාර පරීක්ෂණය - 2013**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) 1. අවශ්‍යතා හා වුවමනා නිර්වචනය කර දක්වන්න.
2. අවශ්‍යතා හතරක් නම් කර එම අවශ්‍යතාවන්ට ගැළපෙන වුවමනා දෙකක් ඉදිරියෙන් ලියන්න.
3. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් හතරක් ලියන්න.
4. උපකාරක සේවා හතරක් නම් කරන්න.

(2) 1. නිෂ්පාදනය යනු කුමක් දැයි හඳුන්වන්න.
2. කාර්ය විශේෂීකරණය හා විශේෂ ප්‍රාගුණ්‍යය කෙටියෙන් පැහැදිලි කරන්න.
3. භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග ගැලීම් සටහනකින් පෙන්වන්න.
4. සෘජු නිෂ්පාදන හා වක්‍ර නිෂ්පාදනය උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

(3) 1. විද්‍යුත් වාණිජ්‍යය යනු කුමක්ද?
2. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.
3. විවිධ ව්‍යාපාර සංවිධානවල පොදු ලක්ෂණ හතරක් ලියන්න.
4. භාණ්ඩ හුවමාරු අර්ථක්‍රමය බිඳවැටීමට හේතු වූ කරුණු මොනවාද?

(4) 1. සුක්ෂම පරිසරය හා සාර්ව පරිසරය පැහැදිලි කරන්න.
2. සුක්ෂම පරිසර සාධක නම් කරන්න.
3. සාර්ව පරිසර අධ්‍යයන තුළින් හඳුනාගත් ව්‍යාපාර අවස්ථා හතරක් හා තර්ජන හතරක් ලියන්න.
4. පහත ප්‍රකාශවලට අදාළ පරිසර සාධක නම් කරන්න.
(i) "සැහැල්ලු ගුවන් යානා" මත්තල අහසේ පියාසර කරයි.
(ii) "උතුමාණන්" ප්‍රදර්ශනය සඳහා රඟුම් පාලන මණ්ඩලයෙන් අවසර ගත යුතුය.
(iii) මතුගම හරහා සුළිසුළං තත්වයක්.
(iv) වෙළඳපොළ ප්‍රසාරණය කාන්තා විලාසිතා සඳහාය.